**29-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, අපිරිසිදු ලෝකය සමඟ ඇති සියලු නෑකම් කඩා දමා එකම පරම පියා සමඟ ඔබේ බුද්ධියේ යෝගාව තබා ගැනීමෙන් ඔබ මායාට පරාජය නොවේ.

**ප්‍රශ්නය:** සර්ව බලධාරී පරම පියා ඔබ සමඟ සිටියත් මේ යාගයේ මෙතරම් බාධක ඇති වීමට හේතුව කුමක්ද?

**පිළිතුර:** නාටකය අනුව බාධක ඇති විය යුතුයි, මන්ද පාප කලය පිරෙන්නේ යාගයට යක්ෂයන්ගේ බාධා ඇති වූ විටයි. පරම පියාට මේ සඳහා කිසිවක් කළ නොහැකියි; එය නාටකයේ නියමිත දෙයක්. බාධක ඒවි, නමුත් ඔබ ඒවාට බිය විය යුතු නැහැ.

**ගීතය:** මව කවුද? පියා කවුද?

ඕම් ශාන්ති. අසීමිත පියාගේ නියෝග ඔබ දරුවන් අසා තිබෙනවා. ඔබට මේ ලෝකයේ මමා සහ බාබාට භෞතික මට්ටමින් නෑ කම් තිබුණා. මන්ද, පළමු ඇලීම ශරීරය හරහා පළමුව ඇති වන්නේ මවට වන අතර, පසුව පියාටත් ඉන් පසු යහළුවන්ට සහ නෑයින්ට යනාදී වශයෙන්. අසීමිත පියා කියනවා : ඔබේ බුද්ධියේ යෝගාව මේ ලෝකයේ මවගෙනුත් පියාගෙනුත් ඉවත් කර ගන්න කියා. මේ ලෝකය සමඟ තව දුරටත් නෑකම් පවත්වා ගෙන නොයන්න, මන්ද ඒ සියලු සබඳතා අපිරිසිදුයි, කලි යුග ඒවායි. ''ජගත්'' යනු ලෝකයයි. අපිරිසිදු ලෝකයේ ඔබට තිබෙන අපිරිසිදු සබඳතා සමඟ ඇති යෝගාව බිඳ දමා මා වෙත පමණක් සම්බන්ධ වී නව ලොව සමඟ සබඳතාව පවත්වා ගන්න, මන්ද ඔබ දැන් මා වෙත පැමිණිය යුතුයි. එය නෑකමක් ඇති කර ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් පමණයි, වෙන කිසිවක් නැහැ. මෙහි කිසිම අපහසුවක් නැහැ. මඟ පෙන්වීම් ලබන අය නෑකම් ඇති කර ගනී. රන් යුගයේ දී සබඳතා හොඳ අතර පළමු ගණයේ සතෝප්‍රධාන් ඒවාය. ඉන්පසු ඔබ දිගටම පහළට එන අතර සතුටු සබඳතා ක්‍රමයෙන් අඩු වී යයි. දැන්, මේ ලෝකයේ ඇති සියලු සබඳකම් බිඳ දැමිය යුතුයි. පරම පියා මෙසේ කියයි මා සමඟ සබඳතාව ඇති කර ගන්න. ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් සියලු ශාරීරික බැඳීම් කඩා දමන්න. විනාශය සිදු වීමට ඇත. ඔබ දරුවන් දන්නවා, පරම පියාණන්, උත්තරීතර පියාණන් නමින් ද හඳුන්වන, උත්තරීතර ජීවය සේවය කරන්නේ ද නාටකයට අනුව බව. ඔහු ද නාටකයේ බැඳීමට බැඳී සිටිනවා. මිනිසුන් සිතනවා දෙවියන් සර්ව බලධාරී බව හරියට ඔවුන් ක්‍රිෂ්ණා සර්ව බලධාරී ලෙස සිතනවා මෙන්. ඔවුන් ක්‍රිෂ්ණාට ස්ව-දර්ශන චක්‍රයක් දී තිබෙනවා. ඔවුන් විශ්වාස කරනවා ඔහු ඉන් යක්ෂයන්ගේ බෙලි කපන බව. කොහොමනමුත්, ඔවුන්ට තේරෙන්නෙ නැහැ දේවතාවන්ට විනාශකාරී වැඩ කළ නොහැකි බව. ඔවුන්ට එසේ කරන්න බැහැ. අවිහිංසාවේ උත්තරීතර ආගම පිළිපදින්නේ දේවතාවන්ය කියා කියයි. ඔවුන් විනාශකාරී වන්නේ කෙසේද? මිනිසුන් ඉඳගෙන තමන්ට හිතෙන හිතෙන දේ ලියා තිබෙනවා. ඔවුන් ආගම බොහෝ සෙයින් අපහාසයට ලක්කර තිබෙනවා! පරම පියාණන් කියයි පිටි ගෝණියක ඇති ලුණු ලෙසට එම ග්‍රන්ථ වල සත්‍ය ඇතුළත්ව තිබෙනවා. රුද්‍රාගේ දැනුම නැමති යාගයේ නිර්මාණය සහ එයට යක්ෂයන්ගේ බාධා සහ අහිංසක කාන්තාවන්ට වූ හිරිහැර පිළිබඳවත් ඒවායේ ලියැවී තිබෙනවා. ඒවා නිවැරදිව ලියා තිබෙනවා. ඔබ දැන් දන්නවා ග්‍රන්ථ වල මොනවද වැරදි මොනවද හරි කියා. පරමාත්ම දෙවියන් තමන් විසින්ම කියනවා රුද්‍ර දැනුම නැමති යාගයේ අනිවාර්යෙන්ම බාධා තිබෙනවා. එය නාටකයේ නියම වූ දෙයක්. පරමාත්ම දෙවියන් ඔබ සමඟ කියා ඔහු බාධා ඉවත් කරනවා කියා දෙයක් නැහැ. පරම පියා ඒ ගැන කුමක් කරන්නද? එය නාටකය තුළ සිදු විය යුතු දෙයක්. පාප කලය පිරෙන්නේ සියලු දෙයින් බාධා පැමිණි කල පමණයි. පරම පියා කියා දෙනවා නාටකයේ සිදුවන්නේ එසේ සිදුවීමට තීරණය වූ දේ පමණයි කියා. යක්ෂයන්ගෙන් අනිවාර්යෙන් කරදර පැමිණෙනවා මොකද අපේ රජදහන ගොඩනැගෙමින් පවතිනවා. මිනිසුන් කල්ප බාගයක්ම එවන් තමෝප්‍රධාන් සහ දූෂිත බුද්ධියක් සහිතව මායාගේ රජදහනේ සිටිනවා. පරම පියාගේ කාර්යය නම් ඔවුන් උසස් තත්ත්වයට ගෙන ඒමයි. ඔබ පරිහානියට පත් වීමට කල්ප බාගයක් ගියා. ඉන්පසු පරම පියා ඔබව තත්පරයෙන් උසස් කරනවා. විශ්වාසය ඇති වීමට වැඩි කලක් යන්නේ නැහැ. බොහෝ දරුවන් සිටිනවා විශ්වාසය ඇති ඉක්මනින් පොරොන්දුව දුන්, නමුත් මායාද බොහොම බලවත්. ඇය එක් හෝ වෙනත් කුණාටුවක් මනසට ගෙන එනවා. ඒවා ක්‍රියාවට නොනැඟීමට උත්සාහ කරන්න. ඔබ සියලු දෙනාම උත්සාහ කරනවා. ඔබ තවම ඔබේ කර්මාතීත් තත්ත්වයට පත් වී නැහැ. භෞතික ඉන්ද්‍රියන්ගෙන් කිසියම් දෙයක් හෝ යමක් සිදු වෙනවා. ඔබ කර්මාතීත් තත්ත්වයට පත් වන තුරු අතරතුර

අනිවාර්යෙන්ම බාධක ඇති වනවා. පරම පියා කියා තිබෙනවා උත්සාහ දැරීමෙන් ඔබ අවසානයේ දී කර්මාතීත තත්ත්වයට පත් වන බව. ඉන් පසු ඔබේ ශරීරයට පවතින්න බැහැ. ඒ නිසයි එයට කල් ගත වන්නේ. එක් හෝ වෙනත් බාධකයක් ඇති වනවා, සමහර අවස්ථා වලදී මායා ඔබව පරාජය කරනවා. මේක බොක්සිං ගසා ගැනීමක්. බාබාගේ ස්මෘතියේ සිටීමට අවශ්‍ය නමුත් ඔබට එය කිරීමේ නොහැකියාවක් ඇත. ළදරුවෙක් වර්ධනය වන්නේ ටිකෙන් ටිකය. එසේ මෙයටද කාලයක් ගතවේ. තව ඉතිරිව ඇත්තේ ඉතා කෙටි කාලයකි. සියල්ල රඳා පවතින්නේ ඔබේ උත්සාහය මතයි. නියතයෙන්ම ඔබේ උරුමය පරම පියාගෙන් ලැබෙන්නේ කුමක් සිදු වුවත් මේ සඳහා ඔබේ අවධානය යොමු කළ විටය. මායා නියතයෙන්ම ඔබට විරුද්ධ වෙයි. ඒ නිසාය ඔබ පොරොන්දුවක් වන්නේ. මායා ද සුළු නැත. ඇ ඉතා සාමාන්‍ය ක්‍රමයටයි එන්නේ. වැඩි බරක් ඇති අය වෙත ඇය එන්නේ විශාල බලයක් යොදමිනි. එවැනි දේ ආගමික ලේඛන වල සඳහන් ව නැත. පරම පියා මෙසේ කියයි දැන් මම ඔබ දරුවන්ට විස්තර කර දෙමි. ඔබ පරම පියාගෙන් ගැලවීම ලබයි. එවිට ඔබට තව දුරටත් මේ ඥානය අවශ්‍ය නැත. ඔබ ඥානය තුළින් ගැලවීම ලබයි. ස්වර්ණමය යුගය ගැලවීම නම් වේ. ඉතින් සුමිහිරි දරුවනි, ඔබට මේ ඉලක්කය දී ඇත. ඔබ දන්නවා නාටකයට අනුව වෘක්ෂය වර්ධනය වීමට කාලයක් ගන්නා බව. බොහෝ බාධක එයි. වෙනසක් සිදු විය යුතුයි. ඔබ සිප්පි කටු සේ සිට දියමන්ති බවට පත් විය යුතුයි. අහස පොළොව සේ වෙනසක් ඇත. අද ද, දෙවි දේවතාවන්ට මිනිසුන් දිගටම සිද්ධස්ථාන හදයි. ඔබ බ්‍රහ්මින් වරු සිද්ධස්ථාන නොහදන්නේ, එය භක්ති මාර්ගය නිසාය. භක්ති මාර්ගය දැන් අවසන් විය යුතු බව ලෝකයා නොදන්නා අතර ජයග්‍රහණය හිමි වන්නේ ඥාන මාර්ගයටයි. ඔබ දරුවන් පමණී මෙය තේරුම් ගන්නේ. මිනිසුන් සිතන්නේ කලියුගය තාමත් ළදරු තත්ත්වයේ ලෙසයි. ඔවුන්ගේ හැම දෙයක්ම ලේඛන මත රඳා පවතී. පරම පියා මෙහි සිට ඔබට සියලු වේද ග්‍රන්ථ ආදියේ රහස් කියා දෙයි. පරම පියා මෙසේ කියයි ඔබ මේ දක්වා ඉගෙන ගත් හැම දෙයක් ම දැන් අමතක කර දමන්න. එයින් කිසිවෙකුට ගැලවීම නොලැබේ. බොහෝ අයට එයින් තාවකාලික සතුටක් ලැබුණත් එයින් නිරන්තර සතුට ලැබිය නොහැකිය. එය මොහොතක සතුටකි. මිනිසුන් සිටින්නේ දුකිනි. සත් යුගයේ දී දුක යන නම හෝ සුළු ප්‍රමාණයකින්වත් එය නැති බව මිනිසුන් නොදනී. ඔවුන් ඒ ගැන ලියා ඇත්තේ - කැන්ස් නමින් යක්ෂයෙක් ක්‍රිෂ්ණා දේශයේ ද සිටි බවත් ක්‍රිෂ්ණා උපන්නේ සිරමැදිරියක දී බවත් ආදී ලෙසිනි. එවැනි කතන්දර බොහෝ ලියා ඇත. සත් යුගයේ අංක එකේ කුමරා වන ක්‍රිෂ්ණා කළ පව් මොනවාද? ඒ සියල්ල මිත්‍යා කතාය. ඔබ දැන් මේවා දන්නේ පරම පියා ඔබට සත්‍යය කියා දී ඇති නිසාය. පියා පමණී පැමිණ සත්‍ය දේශය ස්ථාපනය කරන්නේ. සත්‍ය දේශයේ එතරම්ම සතුටක් තිබෙන අතර අසත්‍ය දේශයේ ඇත්තේ එතරම්ම දුකකි. මිනිසුන් මේ සියල්ල අමතක කර ඇත. ඔබ දන්නවා ශ්‍රීමත් අනුගමනයෙන් ඔබ සත්‍ය දේශය ස්ථාපනය කරන බවත් එහි අයිති කරුවන් වන බවත්. පරම පියා මෙසේ විස්තර කරයි ශ්‍රීමත් අනුගමනයෙන් ඔබට ඉහළ තත්ත්වයක් ලැබිය හැකියි. ඔබ දරුවන් දන්නවා ඔබ මෙම අධ්‍යයනය කර සූර්ය වංශයේ අධිරාජ්‍යයන් හා අධිරාජිණියන් විය යුතුයි. හැම කෙනෙකුටම ඉහළ තත්ත්වයක් අවශ්‍යයි. හැම කෙනෙක්ම දිගටම උත්සාහයක් ද කරයි. ඉතා හොඳ, ස්ථිර භක්තිවන්තයින් ඔවුන් ළඟ පිංතූර තබා ගෙන එය නැවත නැවත සිහිකරයි. බාබා මෙසේ කියයි ඔබ වෙත ත්‍රිමූර්ති පිංතූරයක් තබා ගත යුතු අතර එය ද නිතර නිතර සිහි කරන්න. පරම පියා සිහි කිරීමෙන් අපි සූර්ය වංශයට යමු. ඔබේ කාමරයේ ත්‍රිමූර්ති පිංතූරයක් තබා ගත් විට ඔබේ දැක්ම නිතර නිතර ඒ මත වැටේ. බාබා තුළින් අපි සූර්ය වංශයට අයත් වේ. එවිට ඔබ නැගිට්ට හැටිය පාන්දරම ඔබේ දැක්ම ඒ වෙත යයි. එයද උත්සාහ කිරීමේ මාර්ගයයි. බාබා මෙසේ උපදෙස් දෙයි. ඉතා හොඳ භක්තිවන්තයින් බොහෝ උත්සාහයන් කරයි. ඔවුන් ඉදිරියේ ක්‍රිෂ්ණාගේ පිංතූරයක් තබා ගෙන ඇස් විවෘත වූ විගස ක්‍රිෂ්ණා සිහිකර ගනී. ඔබට, මෙය තවත් පහසුය. ඔබට පහසුවෙන් ස්මෘතියේ සිටිය නොහැකි නම්, ඒ මායාගේ කරදර මේ පිංතූර වල උදව්වෙන් නැති වී යයි. ශිව බාබා බ්‍රහ්මා තුළින් අප විශ්ණු දේශයේ අයිතිකරුවන් බවට පත් කරවයි. බාබා තුළින් අප ලෝක හිමිකරුවන් බවට පත් වෙමු. මෙය නිරතුරුවම සිහිකිරීමෙන් ඔබට බොහෝ උදව් ලැබේ. බොහෝ විට අමතක වන ළමුන්ට බාබා මෙසේ උපදෙස් දෙයි ඔබ ඉදිරියේ පිංතූර තබා ගත් විට පරම පියාත් උරුමයත් සිහිවේ. කොහොමනමුත්, ඔබ බ්‍රහ්මා සිහි කළ නොයුතුයි. යුවළක් එකතු වූ කල ඔවුන් කපුවා සිහිකරමින් නොසිටියි. බාබා හොඳින් සිහිකළ විට බාබා ද ඔබව සිහි කරයි. ස්මෘතිය වැඩි ස්මෘතියක් ගෙන එයි. ඔබ දැන් දන්නවා ආදරවන්තයාගේ කාර්යය. ශිවාට බොහෝ භක්තිවන්තයින් ඇත. ඔවුන් දිගටම ''ශිවා, ශිවා'' කිව්වත් එය වැරදියි. ඔවුන් කාෂි හි ශිවා සිහිකර ඔහු ලෝකයේ ස්වාමියා සේ සලකා ගංගා නම් ගඟ ගැන කතා කරයි. ඔවුන් ගොස් ගංගා දාරයේ වාඩි වෙයි. පරම පියා ඥාන සාගරය බව ඔවුන් නොදනී. බොහෝ විදේශිකයින් බරණැස බලන්න යයි. එහි බොහෝ විශාල ගංගා දාර ඇත. කොහොමනමුත්, සියලු දෙනාගේම පියාගේ සිද්ධස්ථානය හැම දෙනාගේම ආකර්ෂණය ලබයි. හැම කෙනෙක්ම එහි යයි. සිද්ධස්ථානය කිසි කෙනෙක්

වෙත නොයයි. එම සිද්ධස්ථානයන් හි ඇති දෙවි දේවතා ප්‍රතිමා මිනිසුන් ආකර්ෂණය කරයි. ශිව බාබා ද හැම කෙනෙක් ම ආකර්ෂණය කරයි. ශිව බාබා අංක එක වන අතර, ඊළඟට විශ්ණු, එනම්, බ්‍රහ්මා හා සරස්වතී අංක දෙක වේ. විශ්ණු එවිට බ්‍රහ්මා බවට පත් වේ. ඊළඟට බ්‍රහ්මින්වරු විශ්ණු දේශයේ දෙවි දේවතාවුන් බවට පත් වේ. විශ්ණු දේශයේ දෙවි දේවතාවරු නැවත බ්‍රහ්මින්වරු බවට පත් වේ. ඔබේ කාර්යය එයයි. දැන් අපි දේවි දේවතාවරුන් වෙමින් සිටින අතර ඒ නිසාම අප අන් අයට මාර්ගය කියා දිය යුතුයි. අන් සැම දෙනාම ඔබව මහ වනයට රැගෙන යයි. ඔබ අන් හැම කෙනෙක් ම වනයෙන් පිටට ගෙන උයනට ඇතුළු කරයි. ශිව බාබා පැමිණ කටු මල් බවට පත් කරයි. ඔබද කරන්නේ එම කාර්යයයි. ඔබ පමණයි මේවා තේරුම් ගන්නේ. ඔබට තේරුම් කර දිය හැකි රජවරු හෝ රැජිණියන් නැත. පාණ්ඩවයින්ට වර්ග අඩි තුනක ඉඩමක් හෝ නොලැබුණ බව සිහි කෙරේ. ඔවුන්ගේ පියා බලවත් වූ අතර ඔහු ඔවුන්ට ලෝක ආධිපත්‍යය ලබා දුන්නේය. එම කොටසම දැන් රඟ දැක්වේ. පරම පියා අප්‍රසිද්ධය. ක්‍රිෂ්ණාට බාධක තිබිය නොහැකිය. පරම පියා දැන් පැමිණ ඇති නිසා ඔබ ඔහුගෙන් උරුමය ලබා ගත යුතුයි. මෙයට උත්සාහයක් කළ යුතුයි. දිනෙන් දින නව කරුණු දිගටම මතුවේ. ඔබට පෙනේවි ප්‍රදර්ශන වලදී මේවා විස්තර කරන විට ප්‍රශ්න ඇති වන බව. සියල්ල බුද්ධිය යොදා කළ යුතුය. වැඩි බලපෑමයක් ඇත්තේ ප්‍රදර්ශනයකද ප්‍රක්ෂේපණයක් තුළින්ද? ඔබ ඔවුන්ට විස්තර කරන විට ප්‍රදර්ශනයකදී ඔවුන්ගේ මුහුණු බලා ගත හැකියි. සත්‍ය ගීතාවේ පියා පරමාත්ම දෙවියන් බව තේරුම් ගත් විට ඔබ උරුමය ලැබීමට උත්සාහ වන්ත වෙයි. මේ සඳහා දින හතක් වැය කළ යුතුයි. මේ ගැන ලියා ඉදිරිපත් කරන්න! එසේ නැති වූ විට ඔවුන් පිට ගිය විගස, මායා ඔවුන්ට අමතක කරවයි. ඔබේ බුද්ධියට ඇතුළු වී තිබෙනවා චක්‍රය පුරා ඔබ උපත් 84ක් ගෙන ඇති බවත් දැන් ඔබ ආපසු ගෙදර යා යුතු බවත්. ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් බවට පත් විය යුතුයි. මේ පිංතූර ඔබ ළඟ තිබිය යුතුයි. ඒවා ඉතා හොඳයි. බිර්ලා මහතා ආදීන් වත් දන්නේ නැහැ කෙසේ කවදා ලක්ෂ්මි සහ නාරායන ඔවුන්ගේ රජදහන වාසනාව ලැබුවාද කියා. ඔබ මේවා දන්නා නිසා විශාල සතුටක් ලැබිය යුතුයි. ඔබ ලක්ෂ්මි නාරායන පිංතූරයක් ලබාගෙන ඉක්මනින් අන් අයට තේරුම් කළ යුතුයි ඔවුන්ට ඒ තත්ත්වය ලැබුණේ කෙසේද කියා. මේ කරුණු සියල්ල. බුද්ධියට තේරුම් ගෙන විස්තර කර දිය යුතුයි. ගමනාන්තය ඉතා ඉහළයි. ගුරුවරයන්ට අනුව ඔබ කරන සේවයද කෙරේ. බාබාට දැකිය හැකියි ඔවුන්ගේ මධ්‍යස්ථාන හොඳ තත්ත්වයක් ඇතිව රැකබලා ගන්නා අය. හැම කෙනෙකුටම කුල්මත් බවක් තිබෙන නමුත් හෘදසාක්ෂිය මෙසේ කියයි ගුරුවරුන් හොඳ නම්, දිගටම හොඳ සේවයක් සිදුවේ. හැම කෙනෙකුටම දක්ෂ විය නොහැකියි. හැම කෙනෙකුටම එකම ගුරුවරයාද නොලැබේ. ගිය කල්පයේ සිදු වූ දේ නාටකය අනුව දැන් එසේම සිදු වේ. පරම පියා මෙසේ කියයි ඔබේ තත්ත්වය දිගටම නිමවා ගන්න. මෙය හැම චක්‍රයකම ගණුදෙනුවයි. දැක ඇත්තේ හැම කෙනෙකුටම ගිය කල්පයට අනුවම ක්‍රියා කරන බවයි. එවිට එම සතුට ද සාමය ද ඇති වේ. පරම පියා මෙසේ කියයි ක්‍රියාවන් කරන විට බාබාගේ ස්මෘතියේ සිටින්න. ඔබේ බුද්ධියේ යෝගාව එහි ස්ථිර වන අතර ඔබ බොහෝ යහපතක් අත්දකී. මෙය හරියට කරන අයට ආනිසංස ලැබේ. ඔබ හොඳක් කළ විට, ඔබට හොඳ දෙයක් ලැබේ. හැම කෙනෙක්ම දිගටම වැරදි ක්‍රියා කරන්නේ මායාගේ අණ අනුගමනය කිරීම නිසාය. ඔබට දැන් මෙසේ ශ්‍රීමත් ලැබේ. ඔබ හොඳ කරන්න ඔබට ද හොඳක් සිදු වේ. ඔබ ඔබටම උදව් කරගත යුතුයි. ඔබ කරන දේ අනුවම ඔබට ආනිසංස ලැබේ. අපි හොඳින් යෝගා තබා ගෙන දිගටම සේවය කළ යුතුයි නේද? ඔබේ ජීවිත කාලයද යෝගා වලින් ඉහළ යයි. ස්මෘති වන්දනා ගමනේ සිටීම නිසා අප අසනීප වලින් ද නිදහස් වනු ඇත. එමනිසා, ඇයි අපි බාබා සිහි නොකරන්නේ? මෙය නිවැරදි නම් අප එය නොකරන්නේ ඇයි? ඥානය ඉතා පහසුය. කුඩා ළමුන්ටද මෙය තේරුම් ගෙන අන් අයට ද තේරුම් කළ හැක. එසේ වුවාට ඔවුන් යෝගීන් නොවේ. ඉතා ස්ථිර ලෙසම ඔබ කියන්න පරම පියා සිහිකළ යුතු බව. ඔවුන්ට දිගින් දිගටම අමතක වේ නම්, ඔවුන් වෙත පිංතූර තබා ගත යුතුයි. එය ඉතා හොඳ ක්‍රමයකි. උදේ පාන්දර අවදි වූ විගස, පිංතූර දකින විට, ඔබට සිහි වෙයි ඔබ මෙම ස්මෘතිය නිසා විශ්ණු දේශයේ උරුමය ශිව බාබා වෙතින් ලබන බව. මේ ත්‍රිමූර්ති පිංතූර ප්‍රධානය. ඔබ දැන් එහි තේරුම දන්නවා. ලෝකයේ වෙන කිසිම කෙනෙකුට මෙවැනිම වූ පිංතූර නැත. මෙය ඉතා පහසුය. අප එය ලීවාත් නැතත්, කවුරුත් දන්නවා බ්‍රහ්මා තුළින් ස්ථාපනය සිදුවන බවත් විශ්ණු තුළින් එය පවත්වා ගැනීම සිදුවන බවත්. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මායා සමඟ බොක්සිං තරඟයෙන් කෙදිනකවත් පරාද නොවීමට ප්‍රවේශම් වන්න. පසුගිය චක්‍රය පිළිබඳ සිහිය ඇතිව ඔබේ තත්ත්වය නිර්මාණය කර ගන්න. සතුටින් හා සාමයෙන් සිටින්න.
2. ඔබ ඔබටම හොඳ කර ගැනීමට නම්, ශ්‍රීමත් පිළිපදින්න. මෙම ජරාජීර්ණ ලෝකයේ සියලු සබඳකම් කඩා දමන්න. මායාගේ කුණාටු වලින් ආරක්ෂා වීමට නම් ඔබ ඉදිරියේ පිංතූර තබාගෙන පියා හා උරුමය සිහි කරන්න.

**වරදානය:** පරම පියාගේ සියලු දේපළ ඔබේම කර ගෙන එය මතගැමෙන් දිව්‍ය බුද්ධියක ආශිර්වාදය ලබා ගන්න.

පරම පියාගෙන් ඔබට ලැබෙන සියලු වස්තු මතගැමෙන් ඔබ තුළ එය ඒකාබද්ධ වේ. සෑම කෙනෙකුටම එකම දේපළ ලැබී ඇත, නමුත් එය මතගැමෙන් තමන්ගේ කර ගන්නා අයට එහි කුල්මත් බව සහ සතුට ඇත. මේ නිසා මෙසේ කියනු ලැබේ: ඔබේම අමුද්‍රව්‍ය අඹරන්න, එවිට ඔබ කුල්මත් වනු ඇත. ඒවා මතගැමෙන් කුල්මත් වී සිටින අයව ලෝකයේ කිසිම දෙයකින් හෝ කිසිදු ගැටළුවකින් ඇද ගත නොහැක. ඔවුන්ට දිව්‍ය බුද්ධියක් ලැබීමේ ආශිර්වාදය ඉබේටම ලැබේ.

**පාඨය:** ඔබේ මනසෙහි ඕනෑම ගැටළුවක් අවසන් කිරීම සඳහා, ඔබේ තීරණ ගැනීමේ බලය වැඩි කරන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානීකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

කිසිවිටෙකත් ඔබ සැමවිටම හිස නමා සිටින නමුත් කිසිවෙකු ඔබට ගරු නොකරන බව හෝ හිස නොනමන සහ බොරු කියන අයට පමණක් ගෞරව කරන බව නොසිතන්න. නැත; එය තාවකාලිකයි; ඔබට දුරදක්නා බුද්ධියක් තිබිය යුතුය. දැන් ඔබ වැඩි වැඩියෙන් මිනිසුන්ට හිස නමන තරමට, එනම්, ඔබට වැඩි නිහතමානීකමක් ඇති තරමට, සියලු ජීවාත්ම මුළු චක්‍රය පුරාම ඔබට හිස නමනු ඇත. ස්වර්ණමය සහ රිදී යුගයේදී, ඔවුන්ගේ රජවරු භෞතිකව හිස නමන්නේ නැත, නමුත් ඔබ කෙරෙහි ඇති එම ගෞරවයෙන් ඔවුන් මනසින් හිස නමනු ඇත, තඹ සහ යකඩ යුගයේදී, ඔවුන් භෞතිකව හිස නමනු ඇත.